# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2124/40 - 2019 මැයි මස 24 වැනි සිකුරාදා - 2019.05.24

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**ජාතික රාජ්‍ය සභාවේ 1972 අංක 1 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ පනතේ 27 අ වගන්තියේ (4) වැනි උපවගන්තිය යටතේ වූ නියමය**

1981 අංක 39 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ (විශේෂ විධිවිධාන) පනතින් සංශෝධිත ජාතික රාජ්‍ය සභාවේ 1972 අංක 1 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ පනතේ 27 අ වගන්තියේ 4 වන උපවගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය ගයන්ත කරුණාතිලක වන මම,

(අ) 1958 අංක 4 දරන ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථා පනත යටතේ පිහිටුවන ලද ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවට පවරා දී ඇත්තා වූ ද, මෙම නියමයේ පළමුවන උපලේඛනයේ සවිස්තර ලෙස දක්වා ඇත්තා වූ ද, වලහන්දූව වත්ත යනුවෙන් හඳුන්වනු ලබන සහ සඳහන් කරනු ලබන ඉඩම හා සම්බන්ධව 1994 අප්‍රේල් මස 21 වැනි දින අංක 815/10 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද 1972 අංක 1 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ පනතේ 27 අ(1) වගන්තිය යටතේ කරන ලද නියමයෙහි මෙහි දෙවැනි උපලේඛනයේ දක්වා ඇති වලහන්දූව වත්ත නැමති ඉඩම ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව වෙත පවරනු ලැබීම සඳහා වූ ප්‍රතිෂ්ඨාවට අදාළ නියමයන් හෝ කොන්දේසි අනුව ක්‍රියාකර නොමැතිවීමේ පදනම මත ප්‍රත්‍යාදිෂ්ඨ කිරීම මගින් එම නියමයන් මෙයින් සංශෝධනය කරමි.

(ආ) එම ප්‍රත්‍යාදිෂ්ඨ කිරීම මත මෙම නියමයේ දෙවන උපලේඛනයේ ප්‍රමාණය නිශ්චිතව දක්වා ඇති ඉඩම් ප්‍රමාණය ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව වෙත නැවත පැවරෙන බව මෙයින් ප්‍රකාශ කරමි.

ගයන්ත කරුණාතිලක,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය.

2019 මැයි මස 23 වැනි දින,
''මිහිකත මැදුර'',
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයේ දී ය.

1A - PG 4529 — 27 (2019/05)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

පළමුවන උපලේඛනය

ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව වෙත පවරා ඇති වලහන්දූව වත්ත නම් වූ ඉඩමේ විස්තර

| අති විශෙෂ ගැසට් පත්‍රයේ අංකය සහ දිනය | ඉඩමේ නම | පරිපාලන දිස්ත්‍රික්කය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවට පවරන ලද ඉඩම් ප්‍රමාණය හෙක්. |
|---|---|---|---|---|
| 1994.04.21 අංක 815/10 | වලහන්දූව වත්ත | ගාල්ල | අක්මීමන | 401 |

දෙවන උපලේඛනය

ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව වෙත නැවත පැවරෙන ඉඩම් කොටසෙහි විස්තර

| විශේෂ අංකය | ඉඩමේ නම | පරිපාලන දිස්ත්‍රික්කය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | ග්‍රාම නිලධාරී කොට්ඨාසය (ගම) | කොමිෂන් සභාවට පැවරෙන ඉඩම් ප්‍රමාණය |
|---|---|---|---|---|---|
| කො/570 | වලහන්දූව වත්ත | ගාල්ල | අක්මීමන | යක්ගහ අක්මීමන වලහන්දූව | දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ අක්මීමන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ යක්ගහ අක්මීමන, වලහන්දූව යන ගම්වල පිහිටි හිමිකම් පිඹුරු අංක 83111. මු. පි. 537 හි. පි. 119223. හි. පි. 91328, හි. පි. 83517, හි. පි. 103839, මු. පි. 352, මු. පි. 1251 හි. පි. 103842, 353, හි. පි. 103841, හි. පි. 152975, 124888, 119212, 119213, මු. පි. 1428, මු. පි. 1478, හි. පි. 103843, 83106, 83109, 83108, 83194, මු. පි. 357, මු. පි. 986, හි. පි. 110504, හි. පි. 83107, 105051, මු. පි. 942, හි. පි. 83197 දරන පිඹුරුපත් වලින් නිරූපිත බිම් ප්‍රමාණය ඇතුළුව වලහන්දූව වත්තේ හෙක්. 401 ක බිම් ප්‍රමාණය වේ. |

06 - 169

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.